السنهالية
٢٢٠

# ඉස්ලාම්හි යහපත් ගුණධර්ම

# الأخلاق في الإسلام



The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 2492727 - fax.2401175 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# الأخلاق في الإسلام

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الأولى: ١٤٢١/٨

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢١هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي

الاخلاق في الإسلام - الزلفي.

٣٢ ص ؛ ١٢ × ١٧ سم

ردمك : ٤ - ٩٢ - ٨١٣ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١ - الاخلاق الإسلامية أ- العنوان

ديوي ٣, ٢١٢ ٢١/١٤٧٦

رقم الايداع ٢١/١٤٧٦

ردمك : ٤ - ٩٢ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: شعبة توعية الجاليات بالزلفي

# ඉස්ලාම්හි යහපත් ගුණධර්ම

සියලු ප්‍රශංසා, ඉස්ලාම් ධර්මය අපහට දායාදයක් ලෙස ලබා දුන්, යහපත් ගුණධර්මයන් අපහට පෙන්වා දුන් හා ඒ වෙනුවෙන් උතුම් දායාදයන් පිළියෙල කර ඇති අල්ලාහ්ටම හිමිවේ. අල්ලාහ්ගේ සාමය හා සමාදානය ඔහුගේ දූතයාවූ නබි මුහම්මදු (සල්) තුමානන්ටද, එතුමාගේ පවුල් ඥාතීන් හා අනුගාමිකයින් ඇතුළු සැම දෙනාටමද ලැබෙනු මැනවි.

යහපත් ගුණධර්මයන් නබිවරුන්ගේ හා යහපත් ශීලීන්ගේ ලක්ෂණයන්ය. මෙයින් මිනිසාගේ තරාතිරම උසස්වේ. අල්ලාහ් තම නබිවරයාවූ මුහම්මදු (සල්) තුමාව, ඔහු යහපත් ගුණධර්ම යන් අඩංගු ශ්‍රේෂඨයෙකු බව සඳහන් කරන වැකියක් මගින් මෙලෙස වර්ණනා කරන්නේය.

﴿وَإِنَّكَ لَعَلَى خُلُقٍ عَظِيمٍ﴾ [القلم :٤]

තවද, (නබිතුමනි) නිශ්චය වශයෙන්ම, ඔබ ඉමහත් උතුම්වූ ගුණධර්ම ශීලයෙන් සිටින්නේය. *(අල්කුර්ආන්-68:4)*

යහපත් ගුණාධර්මයන් ආදරය හා ඇල්ම ඇති කරන අතර, අයහපත් ගුණාංගයන් කෝපය හා ඊර්ෂ්‍යාව ඇති කරයි. කවරෙකුගේ ගුණාංගයන් යහපත් ශීලයෙන් පවතින්නේද, ඔහුට එය මෙලොවෙහි හා පරලොවෙහි පලය ලබා දෙයි. ඔහුට අල්ලාහ් යහපත් ගුණධර්මය හා බිය භක්තිය එකතුකර ලබා දෙයි. මේ බව නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[أَكْثَرُ مَا يُدْخِلُ النَّاسَ الْجَنَّةَ تَقْوَى اللهِ وَحُسْنُ الْخُلُقِ] (رواه الترمذي والحاكم)

මිනිසුන් ස්වර්ගයෙහි පිවිසීමට අධික හේතූන් ලෙස පවතින්නේ, අල්ලාහ් පිළිබඳ බිය භක්තිය හා යහපත් ගුණධර්මයන්ය.

*(තිර්මිදි හා හාකිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

යහපත් ගුණධර්මය යනු, මුහුණේ ප්‍රබෝධය, යහපත් කාර්‍ය යන්හි යෙදීම හා මිනිසුන්ට අවහිර වශයෙන් පවතින දේ ඉවත් කිරීම යනාදියන්ය. මේවා යහපත් කියමන්, කෝපය වැළකීම, එය සැඟවීම, හා හිරිහැරයන් ඉවත් කිරීම වැනි මුස්ලිමෙකු අනිවාර්යයෙන් පිළිපැදිය යුතු කරුණු හා සමග පවතී. මුහම්මදු නබි (සල්) තුමා මෙලෙස පවසන්නේය.

[بُعِثْتُ لأُتَمِّمَ مَكَارِمَ الْأَخْلَاقِ] (رواه أحمد والبيهقي والحاكم)

සත් ගුණධර්මයන් පරිපූර්ණ කිරීම සඳහා මා එවා ඇත්තෙමි.

*(අහ්මද්, බයිහකී හා හාකිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමානන් අබූහුරෛරා (රලි) තුමා අමතා 'ඔබ යහපත් ගුණධර්මයන් පිළිපදින්න' යනුවෙන් උපදෙස් කළ විට ඔහු 'නබිතුමනි, යහපත් ගුණධර්මයන් යනුනේ කුමක්ද?' යනුවෙන් ඇසීය. එවිට එතුමා 'ඔබෙන් වෙන්වී සිටින්නන් එකතු කරන්න. ඔබට අපරාධය කළ අයට සමාව ලබා දෙන්න. ඔබට නොදෙන අයට ඔබ ලබා දෙන්න' යනුවෙන් පැවැසීය.

*(බයිහකී ග්‍රන්ථය ඇසුරෙනි)*

මුස්ලිම් සහෝදරයිනි, මෙම සත් ගුණධර්මයට අයත් ඉමහත් පල ප්‍රයෝජනය හා කුලිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[إِنَّ الرَّجُلَ لَيُدْرِكُ بِحُسْنِ خُلُقِهِ دَرَجَةَ الصَّائِمِ الْقَائِمِ] (رواه أحمد)

නිසැකයෙන්ම, මිනිසෙකු තම යහපත් ගුණාංග මගින් (දහවල් කාලයෙහි) උපවාසයෙහි යෙදු හා (රාත්‍රී කාලයෙහි) සිට ගෙන නැමදුමෙහි නිරතවූ අයගේ තරාතිරම ලබන්නේය.

*(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා යහපත් ගුණධර්මය විශ්වාසයෙහි පරිපූරණත්වය බව නිශ්චය කරමින් මෙසේ පවසන්නේය.

[أَكْمَلُ الْمُؤْمِنِيْنَ إِيْمَانًا أَحْسَنُهُمْ خُلُقًا] (رواه ابو داود)

විශ්වාසීන් අතර පරිපූරණ විශ්වාස වන්තයා ඔවුන් අතර ගුණ ධර්මයෙන් යහපත් ශීලයාය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිතුමාගේ පහත සඳහන් වදන කෙරෙහි ඔබේ අවධානය යොමුකරන්න.

[أَحَبُّ النَّاسِ إِلَى اللَّهِ أَنْفَعُهُمْ ، وَأَحَبُّ الْأَعْمَالِ إِلَى اللهِ – عز وجل– سُرُوْرٌ تُدْخِلُهُ عَلَى مُسْلِمٍ، أَوْ تَكْشِفُ عَنْهُ كُرْبَةً، أَوْ تَقْضِيْ دَيْنًا، أَوْ تَطْرُدُ عَنْهُ جُوْعًا، وَلَأَنْ أَمْشِيَ مَعَ أَخِي الْمُسْلِمِ فِيْ حَاجَةٍ أَحَبُّ إِلَيَّ مِنْ أَنْ أَعْتَكِفَ فِي الْمَسْجِدِ شَهْرًا. (رواه الطبراني)

අල්ලාහ් වෙත මිනිසුන් අතර, ඉතා ප්‍රිය වන්තයා මිනිසුන්ට ප්‍රයෝජනය වන්නාය. අල්ලාහ් වෙත ක්‍රියාවන් අතර ඉමහත් ප්‍රිය ක්‍රියාව, මුස්ලිම්වරයෙකු සතුටු කිරීම හෝ ඔහුගේ දුෂ්කරතා වයන් ඉවත් කිරීම හෝ ඔහුගේ ණයක් පියවීම හෝ ඔහුගේ කුස ගින්න නිම කිරීම වේ. මුස්ලිම් සහෝදරයෙකුගේ අවශ්‍ය තාවය නිමිතිකොට ඔහු සමග මා පිටත්වීම දේවස්ථානයේ මාස යක් රැඳී (ඉ:තිකාෆ්) සිටීමට වඩා මාහට ඉතා ප්‍රියයෙකි. *(තබරානි ග්‍රන්ථය ඇසුරෙනි)*

මුස්ලිම් සොයුර, ඔබ පවසන කුමන කියමනක් සඳහා කුලිය තිබේද, එය ඔබට දානයෙකි. නබි මුහම්මදු (සල්) තුමා මේ බව මෙසේ පවසන්නේය.

[... وَالْكَلِمَةُ الطَّيِّبَةُ صَدَقَةٌ] (متفق عليه)

යහපත් කියමන්ද සදකාවකි. *(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

මෙම යහපත් කියමන් සඳහාද උතුම් පල ප්‍රයෝජන ලැබේ. මෙය සිත් සමීප කරයි. සිත්සතන් තුල ප්‍රිය බිහිකර අසතුටුකම

තුරන් කරයි. නබිතුමාගේ මාර්ගය යහපත් ගුණධර්මයන් ඇති කරන අතර, අධික හිරිහැරයන් ඉවසා සිටින ලෙසද උනන්දු කරමින් පවතී. එතුමා මෙසේද පවසන්නේය.

[اتَّقِ اللَّهَ حَيْثُمَا كُنْتَ ، وَأَتْبِعِ السَّيِّئَةَ الْحَسَنَةَ تَمْحُهَا ، وَخَالِقِ النَّا سَ بِخُلُقٍ حَسَنٍ] (رواه الترمذي)

ඔබ කුමන ස්ථානයක සිටියද, අල්ලාහ් කෙරෙහි බිය භක්තියෙන් සිටින්න. යම් අකුසලක් සිදුවූ විගස කුසලක් කරන්න. එය එම අකුසල මකා දමයි. මිනිසුන් අතර විනිවිද භාවයෙන් හැසිරෙන්න.

*(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

සෑම ස්ථානයෙහි හා සෑම කාලයෙහි යහපත් ගුණධර්මයන් පිළිපැදීම මුස්ලිම් වරයෙකුට අවශ්‍යවේ. එය ඔහු ගමන් කරන සෑම මාර්ග හා ස්ථානයෙහි මිනිසුන් අතර ඔහුව ප්‍රියකර සමීප කිරීමට හේතුවේ. කෙනෙකු තම බිරිඳගේ මුඛයට කවන කෑම පිඩුවක් සඳහා පවා ඉස්ලාම් ධර්මයෙහි කුලිය ලැබෙන්නේය. මේ බව නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[وَإِنَّكَ مَهْمَا أَنْفَقْتَ مِنْ نَفَقَةٍ فَهِيَ صَدَقَةٌ، حَتَّى اللُّقْمَةَ تَرْفَعُهَا إِلَى فِي امْرَأَتِكَ] (رواه البخاري)

ඔබ කුමක් වියදම් කළද, එය දානයෙකි. කෙතරම්තම්, ඔබ සිය බිරිඳගේ මුඛයට කවන කෑම පිඩුවක් පවාද දානයෙකි.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

ප්‍රිය වන්තයිනි, සෑම විශ්වාස වන්තයින්ම සහෝදරයන්ය. තමාට කැමැති දේම තම සහෝදරයා කෙරෙහිම කැමැතිවීම මුස්ලිම් වරයෙකුටම අනිවාර්යවේ. ඔබ ඔබට කුමක් ප්‍රිය කරන් නේද ? යනුවෙන් සිතන්න. ඒ දේම ඔබ සහෝදරයාටත් ලබා

දෙන්න. එසේම ඔබ අප්‍රියවන දේ ඔබ සහෝදරයාගෙන්ද ඉවත් කරන්න. කවරෙකු අල්ලාහ්ව දෙවියා ලෙසද, ඉස්ලාමය ජීවන මග ලෙසද, මුහම්මදු නබි (සල්) තුමාව වක්තෘවරයා හා දූතයා ලෙසද පිළිගෙන සිටින්නේද, ඔහුව පහත්කමින් සැළකීමෙන් ඔබ වැළකී සිටින්න. මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[بِحَسْبِ امْرِئٍ مِنَ الشَّرِّ أَنْ يَحْقِرَ أَخَاهُ الْمُسْلِمَ] (رواه مسلم)

තම මුස්ලිම් සහෝදරයාව පහත්කමින් සැළකීම මිනිසෙකුට අකුසල් සිදුවීමට ප්‍රමාණවත්වේ. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

මුස්ලිම් සහෝදරයිනි, යහපත් ගුණධර්මයන් පිළිපැදීම, සෑම අවස්ථාවන්හිම සරල ඇදහීමක් වශයෙන්ද, පහසු මගක් ලෙසද පවතී. නබි මුහම්මදු (සල්) තුමානන් අබූදර්දා (රලි) තුමාගෙන් 'ඇදහීම් අතර සරල හා ශරීරයට පහසු ඇදහීමයක් ගැන මා ඔබට දැනුම් දෙන්නෙහිද ?' යනුවෙන් විමසීය. එයට ඔහු 'එසේ මයි නබිතුමනී දැනුම් දෙන්න' යනුවෙන් කීය. එවිට නබිතුමා 'නිශ්ශබ්දයෙන් සිටින්න. සත් ගුණධර්මයන් පිළිපදින්න. ඔබට මෙවැනි වෙනත් කාර්යයක් කළ නොහැක' යනුවෙන් පැවැසීය.

'යහපත් ගුණධර්මයන් මගින් දහවල්හි උපවාසයෙහි යෙදූ හා රාත්‍රියෙහි සිටගෙන වන්දනාමානය කළ අයගේ තරාතිරම ලබන්නේය' යනු නබි වදන්හි සඳහන් සේම, මුළු රාත්‍රියෙහිම වන්දනාමානය කළ හා දහවල්හි උපවාසයෙහි යෙදී සිටින විශ්වාසියෙකු ලබන කුලියට සමාන කුලියක් සත් ගුණදර්මයෙන් විශ්වාසියෙකු ලබයි. මේ අනුව එතුමාගේ අනුගාමිකයාවූ අබූ දර්දා (රලි) තුමා 'මුස්ලිම් දාසයාගේ යහපත් ගුණධර්මය ඔහුව ස්වර්ගයෙහි ප්‍රවේශ කරවයි. එසේම, ඔහුගේ අයපත් ගුණාංගය ඔහුව අපායයෙහි ප්‍රවේශ කරවයි' යනුවෙන් පවසන්නේය.

# යහපත් ගුණධර්මයෙහි සළකුණු

යහපත් ගුණධර්මයෙහි සළකුණු විවිධ ලක්ෂණයන්හි එක්ව පවතී. ඒවා, කෙනෙකු අධිකව ලජ්ජා වන්නෙකු, හිරිහැර නොකරන්නෙකු, වැඩියෙන් කුසල් කරන්නෙකු, සත්‍යය ප්‍රකාශ කරන්නෙකු, අඩුවෙන් කතා බහවල යෙදෙන්නෙකු, කුසල් ක්‍රියාවන් අධිකව කරන්නෙකු, අනවශ්‍ය කාර්යන්ගෙන් වැළකි සිටින්නෙකු, දෙමාපියන්ට උපකාර කරන්නෙකු, ඥාතීන් සමග එක්ව ජීවත් වන්නෙකු, ඉවසීලි වන්නයෙකු, තුති පුදකරන් නෙකු, තෘප්තිමත් වන්නයෙකු, සිහිඳුකමෙන් සිටින්නෙකු, ශාන් තනීය වන්නයෙකු, කන්‍යා භාවය රැකී සිටින්නෙකු හා ආදර වන්නයෙකු ලෙස සිටිය යුතුයි. ඒ අතර, ශාප කරන්නකෙු හෝ දොස්පද කියන්නෙකු හෝ කේළාම් කියන්නෙකු හෝ අඩුපාඩු පතුරුවන්නෙකු හෝ සීඝ්‍ර වන්නයෙකු හෝ වෛරය කරන් නෙකු හෝ ලෝභ වන්නයෙකු හෝ ඊර්ශ්‍යා කරන්නෙකු හෝ ලෙස නොසිටිය යුතුයි.

මුහුණේ ප්‍රබෝධයෙන්ද, මද සිනහ වන්නෙකු ලෙසද සිටිය යුතුයි. අල්ලාහ් වෙනුවෙන් ආදරය කළ, මහු වෙනුවෙන් තෘප්ති මත්වී හා මහු වෙනුවෙන් අප්‍රියද කළ යුතුයි. යහපත් ශීල පුද් ගලයා මිනිසුන් කරන හිරිහැරයන් ගැන ඉවසීමෙන් සිටී. මවුන් වැරදි කරන අවස්ථාවන්හි 'ඒ සඳහා කිසියම් කාරණාවක් ඇති' යනුවෙන් සිතයි. මවුන්ගේ වැරදි හා අඩුපාඩුවන් ගැන සමීක් ෂණය කිරීමෙන් වැළකී සිටීමට සම්පූර්ණයෙන් උනන්දු කරයි. කිසිඳු අවස්ථාවක හෝ විශ්වාසියෙකු අයහපත් ගුණාංග ශීලයා ලෙස සිටිය නොහැක.

යහපත් ගුණධර්මයන්හි වැදගත්කම හා එය පිළිපදින්නන් ලබන උතුම් ප්‍රතිඵලය ගැන නබිතුමා කීප අවස්ථාවන්හි සනාථ කර ඇත. උසාමා බින් ෂරීක් (රලි) තුමා මෙසේ පවසන්නේය.

අපි නබි (සල්) තුමා සමග අසුන්ගෙන සිටින කළ සමහර මිනිසුන් පැමිණ 'අල්ලාහ්ගේ දාසයන් අතර අල්ලාහ්ට ඉමහත් ප්‍රිය වන්තයා කවරෙකුද?' යනුවෙන් එතුමාගෙන් විමසූහ. එවිට එතුමා 'මවුන් අතර ගුණධර්මයෙන් යහපත් ශීලයා අල්ලාහ්ට ඉමහත් ප්‍රිය වන්තයාය' යනුවෙන් පැවැසීය.

*(තබරානි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[ألآ أخبركم بأحبكم إلي، وأقربكم مني مجلسا يوم القيامة] قالوا: نعم يارسول الله ، قال: [أحسنكم خلقا] (رواه أحمد)

'ඔබලා අතර මාහට ඉතාමත් ප්‍රිය වන්තයා හා පරලොවෙහි මාහට ඉතා සමීපයෙන් අසුන් ගන්නා කවරෙකු බව මා ඔබලාට දැනුම් දෙන්නෙහිද ?' යනුවෙන් නබිතුමා ඇසීය. එයට සහාබාවරුන් 'එසේමයි දැනුම් දෙන්න' යනුවෙන් කීහ. එවිට එතුමා 'ඔහු ඔබලා අතර සිටින යහපත් ගුණධර්ම ශීලයාය' යනුවෙන් පැවැසීය. *(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

තවද, නබි මුහම්මදු (සල්) තුමා මෙසේද පවසන්නේය.

[ما من شيء أثقل في ميزان العبد يوم القيامة من خلق حسن...] (رواه أحمد)

පරලොවෙහි දාසයෙකුගේ තරාදියට සත් ගුණධර්මයට වඩා බරවු දෙයක් නොමැත. *(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

# නබිතුමාගේ ගුණධර්ම

නබි මුහම්මදු (සල්) තුමා තම අනුගාමිකයන් කුමන සත් ගුණධර්මය කරා කැඳවූයේද, එතුමා මවුන් අතර එම සත් ගුණ ධර්මයෙන්ම ආදර්ශමත්ව සිටියේය. එතුමා තම සහාබාවරුන්

අතර, තම දැනුම් ඥානය හා උපදෙස් මගින් (පමණක්) යහපත් ගුණධර්මයන් නොවැපිරී ඒවා තම ජීවිතයෙහි පිළිපැදීම මගින් වැපුරුවාය.

අනස් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[خدمت النبي ﷺ عشر سنين، والله ماقال لى أف قط ، ولا قال لشيء : لم فعلت كذا ؟ وهلا فعلت كذا ؟] (رواه مسلم)

මා නබි මුහම්මදු (සල්) තුමාට වසර දහයක කාලයක් සේව කයෙකු ලෙස සිටීමි. එතුමා මාහට කිසිදු අවස්ථාවක 'චී' යනු වෙන් පිළිකුල් ලෙස නොකිව්වේය. කිසියම් කාර්යයක් පිළිබඳව ඇයි ඔබ මෙසේ කළේ? ඇයි ඔබ මෙසේ නොකළේ? යනුවෙන්ද නොඇසීය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

[كنت أمشي مع رسول الله ﷺ وعليه برد غليظ الحاشية ، فأدركه أعرابي فجبذه جبذة شديدة ، حتى نظرت في صفحة عاتق رسول الله ﷺ ، وقد أثرت به حاشية البرد من شدة الجبذة ، ثم قال: يا محمد مر لي من مال الله الذي عندك! فالتفت إليه رسول الله، وضحك، وأمر له بعطاء]

(رواه البخاري)

මා මුහම්මදු නබිතුමා සමග ගමන් කරමින් සිටීමි. එතුමා මත මහත දාර(වාට්ටි)යෙන් යුත් පොරෝනාවක් තිබින. ගම්වැසි යෙකු පැමිණ එය තදෙන් ඇද්දේය. මා නබිතුමාගේ උරහිස කරා බැලුවෙමි. තදෙන් ඇදූ නිසා පොරෝනා දාරයේ ප්‍රතිබිම්බය එහි පැණින. පසුව ඔහු 'මුහම්මද්, ඔබ සතුව ඇති අල්ලාහ්ගේ සම් පත්වලින් මාහට තිකුත් කරන ලෙසට අණ කරන්න යනුවෙන් කීය. එවිට එතුමා 'ඔහු කරා බලා සිනහවීමෙන් පසු ඔහුට එය තිකුත් කරන මෙන් අණ කළාය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිතුමා තම නිවසෙහි කුමක් කරන්නෙහිද ? යනුවෙන් එතුමාගේ බිරඳයෙක්වූ ආයිෂා (රලි) තුමියගෙන් විමසූවිට, එතුමිය 'නබිතුමා නිවැස් කටයුතුවලදී (තම බිරිඳන්හට) සහාය දක්වන්නේය. සලාතයෙහි වේලාව පැමිණ විගස දෝවනය කරමින් සලාතය සඳහා පිටත්වන්නේය.

නබිතුමාගේ අනුගාමික අබ්දුල්ලාහ් බින් හාරිද් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[ما رأيت أحدا أكثر تبسما من رسول الله ﷺ] (رواه الترمذي)

නබි මුහම්මදු (සල්) තුමාට වඩා වැඩියෙන් මද සිනහවන කිසියම් ඉකෙනෙකු මා නොදිට්මි.

*(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිතුමාගේ ප්‍රසිද්ධ ගුණාංගයන් අතර එතුමා ලෝභකමෙන් තොර දානය කිරීමෙහි යහපත් ශීලයාය. සත්‍ය භාවයෙන් කිසි විටක පසුබට නොවන ධෛර්ය වන්තයාය. තීන්දු කිරීමෙහි කිසි විටක අසාදාරණකම් නොකරන යුක්ති ගරුක පුද්ගලයාය. තම ජීවිතයෙහිම සත්‍යශීලයා හා විශ්වාස වන්තයා ලෙස බැබලුවාය. නබි මුහම්මදු (සල්) තුමාගෙන් කිසියම් දෙයක් අයැද, එතුමා එය නොමැති බව කිසියම් දිනක නොපැවැසූ බව ජාබිර් (රලි) තුමා පවසන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබිතුමා තම අනුගාමිකයන් සමග යහළු විහිළුවෙහි යෙදී සිටින්නේය. ඔවුනු සමග එක්වමින් ඔවුන්ගේ දරුවන් සමග විනෝද කරන්නේය. දරුවන් තම ඔඩොක්කුවෙහි වාඩි කරවා ගන්නේය. ආගන්තුක සංග්‍රහ සඳහා කරන ආරාධනා පිළිගන්නෙකු ලෙසද, රෝගීන්ගේ සුවදුක් ගැන විමසන්නෙකු ලෙසද, තම වැරදීන් සඳහා පවසන නිදහසට කරුණු පිළිගන්නෙකු ලෙසද සිටියේය.

නබිතුමා තම අනුගාමිකයන්, ඔවුන් ප්‍රියවන නම්වලින් කැඳ වන්නේය. තමා සමග කරන කිසියම් කෙනෙකුගේ කතාබහ විසන්ධි නොකරන්නේය. එතුමාගේ අනුගාමිකයාවූ අබූකතාදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිතුමාව හමුවීම සඳහා නජ්ජාසි රජතුමාගේ දූත පිරිසක් පැමිණි අවස්ථාවේ එතුමා ඔවුන්ට ආවතේව කළේය. එවිට එතුමා ගේ අනුගාමිකයෙකු 'ඔබතුමා වෙනුවෙන් (ආවතේව කිරීමට) අපි සිටින්නෙමු' යනුවෙන් කීහ. එයට එතුමා 'ඔවුන් අප සහෝ දරයින්ට ගරු කළහ. එහෙයින්, මා ඔවුන්ට ආවතේව කිරීමට ප්‍රියවෙමි' යනුවෙන් පැවැසීය. තවද, එතුමා 'මාද (අල්ලාහ්ගේ) දාසයෙකි. දාසයෙකු ආහාර පානය අනුභව කරන සේම මාද ආහාර පානය අනුභව කරන්නෙමි' යනුවෙන්ද පැවැසීය. එතුමා බූරුවා මත ගමන් කරන්නේය. දිළින්දන්ගේ සුව දුක් විමසන අතර ඔවුන් සමග එකට අසුන්ගෙන සිටින්නේය.

# සත්‍යභාවය

නියත වශයෙන්ම, මුස්ලිම් වරයා තම දෙවියා හා අන් සියලු මිනිසුන් සමග සත්‍ය භාවයෙන් සිටී. එසේම, සෑම අවස්ථාවන්හි තම ප්‍රකාශ හා ක්‍රියාවලදීද සත්‍ය භාවයෙන් සිටී. අල්ලාහ් මෙය මෙසේ පවසන්නේය.

﴿يا أيها الذين آمنوا اتقوا الله وكونوا مع الصادقين﴾ [التوبة:١١٩]

විශ්වාසවන්තයිනි, අල්ලාහ් කෙරෙහි බියෙන් සිටින්න. තවද, සත්‍ය වන්තයන් සමග සිටින්න.

*(අල්කුර්ආන්-9:119)*

ආඉෂා (රලි) තුමිය මෙසේ පවසන්නීය.

[ماكان خلق أبغض إلى رسول الله ﷺ من الكذب...] (رواه أحمد)

අසත්‍යතාවයට වඩා ඉතාමත් පිළිකුල් ගුණාංගයක් මුහම්මදු (සල්) තුමාට නොතිබින.

*(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

විශ්වාස වන්තයා බියගුල්ලා ලෙස සිටීද ? යනුවෙන් නබිතුමා ගෙන් ප්‍රශ්න කළ විට එතුමා 'මව සිටී' යනුවෙන්ද, විශ්වාස වන් තයා ලෝභයා ලෙස සිටීද ? යනුවෙන් ප්‍රශ්න කළ විට එතුමා 'මව සිටී' යනුවෙන්ද පැවැසූ අතර, විශ්වාස වන්තයා අසත්‍ය වන්තයා ලෙස සිටීද ? යනුවෙන් ප්‍රශ්න කළවිට එතුමා 'නොසිටී' යනුවෙන් ද පැවැසීය.

*(මුඅත්තා ග්‍රන්ථය ඇසුරෙනි)*

ධර්මය පිළිබඳ කාර්යයන් අසත්‍ය කිරීම, අකුසල් අතරින් ඉතා පිළිකුල් කමක්ද, අසත්‍ය වර්ගයන් අතර ඉතා දුෂ්ඨ කමක් ද වේ. එයට කුලිය, අපායයෙකි. මක්තිසාදයන්, නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[من كذب علي متعمدا فليتبوأ مقعده من النار] (رواه البخاري)

කවරෙකු හෝ මා ගැන මිතැකමින් අසත්‍ය පවසන්නේද, ඔහු තම අසුන (ස්ථානය) අපායයෙහි පිළියෙල කරගනු.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

දරුවන් සත්‍යභාව ගුණ ධර්මයෙහි වර්ධනයවීමට ඉස්ලාම් ධර්මය දරුවන්ගේ සිත් සතන්තුල එය වැපිරීම සඳහා උනන්දු කරයි.

නබිතුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) මෙසේ පවසන්නේය.

[من قال لصبي: تعال، هاك، ثم لم يعطه فهي كذبة] (رواه أحمد)

කවරෙකු හෝ දරුවෙකු අමතා 'එන්න මෙය රැගෙන යන්න' යනුවෙන් කැඳවා පසුව ලබා නොදෙන්නේද, එයද අසත්‍යයෙකි.

*(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

විනෝදයට වුවද අසත්‍යය කීමෙන් වැළකී සිටින ලෙසට නබි තුමා තම සමාජයන් උනන්දු කර සිටින අතර, විනෝදයට හෝ අසත්‍යය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්නාට ස්වර්ග මධ්‍යයෙහි මාලිගාවක් තනතු ලබන බවට පොරොන්දුවද පළ කරයි. එතුමා මේ ගැන මෙසේ පවසන්නේය.

[أنا زعيم ببيت في وسط الجنة ، لمن ترك الكذب وإن كان مازحا]

(رواه أبو داود)

විනෝදයට වුවද, අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්නාට ස්වර්ග මාධ්‍යයෙහි මාලිගාවක් ලබා දීමට මා පොරොන්දු වෙමි.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

වෙළෙන්දා තම භාණ්ඩ පිළිබඳව විවරණය කිරීමේදී අසත්‍ය පැවැසීමට ඉඩ ඇත. මේ ගැන නබි මුහම්මදු (සල්) තුමා මෙසේ අවවාද කරන්නේය.

[لا يحل لمسلم، يبيع سلعة ، يعلم أن بها داء إلا أخبر به] (رواه البخاري)

භාණ්ඩයෙහි අඩුපාඩුකම් තිබීම දැනගෙනද, එය නොපවසා විකිණීම කිසියම් මුස්ලිම් වරයෙකුට හලාල් (අනුමත) නොවන් නේය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

# භාරකාරත්වය

ඉස්ලාම් ධර්මය, භාරකාරත්වය නිසි පරිදි රකින ලෙසත්, මිනිසා තමා ඉටු කරන කාර්යයන් ලොකු හෝ කුඩා හෝ වේවා ඒ සියල්ලෙහි තම දෙවියා තමාව බලා සිටින බව සිතා ක්‍රියා කළ යුතු බවත් තමා පිළිපදින්නන්ට අණ කරයි. එහෙයින්, මුස්ලිම් වරයෙකු තමාට අල්ලාහ් නියමකර ඇති කාර්යයන් ඉටු කිරීමෙහි හා මිනිසුන් අතර පවතින හැසිරීමෙහි (එනම් තමාට

පවරනලද භාරකාරත්වයෙහි) විශ්වාස භාවයෙන් සිටිය යුතුයි. භාරකාරත්වය යනුවෙන් හැඳින්වන්නේ, මිනිසා තමාට පවරන ලද කාර්යයන් පරිපූරණයෙන් ඉටු කිරීමට උනන්දු වීමකි. මෙය අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إ ن الله يأمركم أن تؤدوا الأمانات إلى أهلها، وإذا حكمتم بين الناس أن تحكموا بالعدل﴾ [النساء:٥٨]

ඔබලාට පවරන ලද භාරකාරත්වය එහි හිමිකරුවන්ට භාර කරන ලෙසද, මිනිසුන් අතර තීන්දු කරන්නේනම්, යුතුකමින් තීන්දු කරන ලෙසද අල්ලාහ්, අණ කරයි.

*(අල්කුර්ආන්-4:59)*

නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[لا إيمان لمن لا أمانة له...] (رواه أحمد)

භාරකාරත්වය පිළිබඳ විශ්වාසනීය භාවය නොවන්නාට විශ් වාසය (ඊමාන්) නොවන්නේය.

*(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

භාරකාරත්වය පිළිබඳ විශ්වාසනීය භාවය යනුවෙන් හැඳින් වන්නේ, සමහරයන් දැන සිටින පරිදි තමා වෙත භාරකරනලද භාණ්ඩ සුරකීම පමණක් නොවන අතර, එය ඉතාමත් තේරුම් සහිතයෙකි. භාරකාරත්වය පිළිබඳ විශ්වාසනීය භාවය ඉටුකිරීම යනුනේ, තමා වෙත පවරන සෑම කාර්යයන් හා ක්‍රියාවන් එය මෙලොව හෝ පරලොව පිළිබඳ කරුණු හෝ වේවා එවා විශ්වාස යෙන් ඉටු කිරීමකි.

# බැගෑපත්කම

මුස්ලිම්වරයා තමාව පහත් කොට නින්දා නොකර, බැගෑපත් කමෙන් ක්‍රියා කළ යුතුයි. ඒ අතරම කිසියම් අවස්ථාවක හෝ අහංකාර කමෙන් නොසිටිය යුතුයි. අල්ලාහ් මේ ගැන මෙලෙස පවසන්නේය.

﴿واخفض جناحك لمن اتبعك من المؤمنين﴾ [الشعراء:٢١٥]

තවද, (නබිතුමනි) ඔබව පිළිපදින විශ්වාසීන් අතර, උරහිස පහත්කර (සිනිඳු කමින්) හැසිරෙන්න.

*(අල්කුර්ආන් -26:215)*

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[ما تواضع أحد لله إلا رفعه] (رواه مسلم)

අල්ලාහ් වෙනුවෙන් බැගෑපත් කමින් හැසිරෙන කිසිවෙකුව අල්ලාහ් උසස් නොකර නොසිටී.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

[إن الله أوحي إلي أن تواضعوا حتى لا يفخر أحد على أحد، ولا يبغى أحد على احد] (رواه مسلم)

ඔබලාගෙන් කෙනෙකු අන් අයෙකුට අහංකාර හා අපරාධ නොකරන තරමට බැගෑපත් කමින් හැසිරෙන ලෙස අල්ලාහ් මාහට (දේව හෙළිදරව්ව මගින්) දැනුම්දී ඇත.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

දිළින්දන් හා දුප්පතුන් සමග අසුන් ගැනීම, ඔවුන් අතර තමා ශ්‍රේෂ්ඨයා ලෙස නොපෙන්වීම, මිනිසුන් සමග මුහුණේ ප්‍රබෝධයෙන් සිටීම හා කෙනෙකු අන් කෙනෙකුට වඩා ශ්‍රේෂ්ඨයා බවට නොසිතීම බැගෑපත්කමෙහි බාහිර ප්‍රතිරූපයන්ය.

නබි මුහම්මදු (සල්) තුමා සමාජයෙහි වක්තෘවරයා ලෙස සිට තම නිවස අතුගාමින්ද, එළුවන්ගෙන් කිරි දොවමින්ද, ඉරුණු තම ඇඳුම් පැළඳුම් මසා ගනිමින්ද, තම ආවතේව කාරයා සමග (එකට වාඩිවී) ආහාර පානය අනුභව කරමින්ද, වෙළඳ පොළට ගොස් අවශ්‍ය දේ මිළදී ගනිමින්ද, කිසියම් භේදයකින් තොරව වැඩිහිටියන්, කුඩා අය, පොහොසත් හා දිළින්දන් සමග අභිනත ගෙත මුඛවර්ණනා කරමින්ද සිටියේය.

# ලැජ්ජාවීම

ලැජ්ජාවීම විශ්වාසයේ කොටසකි. ලැජ්ජාව කුසල් ගෙනදේ. මේ පිළිබඳව බුහාරි හා මුස්ලිම ග්‍රන්ථවල නබි මුහම්මදු (සල්) තුමාගේ වදනක් වාර්තාවේ. එතුමාගේ මෙවැනි විශිෂ්ඨ ගුණාංග යන් මුස්ලිම් වරුන්ට ආදර්ශමත්ව පවතී. මක්නිසාදයත්, නබි තුමා අධිකව ලැජ්ජා වන්නෙකු ලෙස සිටියේය.

අබූ සර්ද් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[...فإذا رأى شيأ يكرهه عرفناه في وجهه] (رواه البخاري)

නබිතුමා පිළිකුල් දෙයක් දුටුවේද, එතුමාගේ මුහුණයෙහිම ඒ බව අපි දැන ගතිමු. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මුස්ලිම් වරයෙකුගේ ලජ්ජාව සත්‍යය පැවැසීමට හෝ දැනුම් ඥානය ලබා ගැනීමට හෝ යහපත් කාර්යයන් කෙරෙහි අණ කිරීමට හෝ අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමට හෝ බාධා වන් ලෙස නොපවතී. උම්මු සුලෙම් (රලි) තුමියගේ ලැජ්ජාව නබිතුමාගෙන් මෙසේ ඇසීමට බාධාවක් නොවීය. 'අල්ලාහ්ගේ දූතයාණෙනි, සත්‍යය පැවැසීමට නිසැකයෙන්ම, අල්ලාහ් ලැජ්ජා නොවන්නේය. ස්ත්‍රියෙකුට සිහිනයෙහි ධාතුව පිටත් වූයේනම්, ඇයට ස්නානය කිරීම අනිවාර්යද?' යනුවෙන් එතුමිය ඇසීය.

එයට එතුමා 'මව් ඇය ධාතුව දුටුවේනම්, ජල ස්නානය කිරීම අනිවාර්ය වේ' යනුවෙන් පැවැසීය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, ලැජ්ජාවීම, අකුසල් කාර්යවල යෙදීම, තමාට පැවරූ කාර්යයන් අඩාල කිරීම, මිනිසුන්ගේ රහසයන් එළි කිරීම හා ඔවුන්ට පීඩා කිරීම යනාදි කාර්යයන් වළක්වයි.

අල්ලාහ් වෙනුවෙන් ලජ්ජාවීම ඉතා උතුම්ය. එනිසා, විශ්වාස වන්තයා තමා මැවූ දෙවියාට ලැජ්ජා විය යුතුයි. ඔහු ඔහුව මවා ඔහුට දායාදයන් ලබා දුන්නේය. එනිසා ඔහුට වහල් වීමෙන්ද, ඔහුගේ දායාදයන් වෙනුවෙන් තුති පුදකිරීමෙන්ද අඩුපාඩු කිරීමට මුස්ලිම් වරයා ලැජ්ජාවිය යුතුයි. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[فالله أحق أن يستحيامنه من الناس] (رواه البخاري)

මිනිසුන්ට වඩා ලජ්ජාවීමට අල්ලාහ් තමා ඉතාමත් සුදුස්සාය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

# අයහපත් ගුණාංගයන්

## අපරාධ කිරීම

සත්‍ය මුස්ලිම් වරයාගෙන් කිසියම් කෙනෙකුට හෝ නින්දා කිරීම නොසිදුවේ. ඉස්ලාමය අපරාධ කිරීම තහනම් කරයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ومن يظلم منكم نذقه عذابا كبيرا﴾ [الفرقان:١٩]

තවද, ඔබලා අතර, කවරෙකු අපරාධ කරමින් සිටින්නේද, අපි ඔහුට විශාල වේදනාවක් (භුක්ති විඳීමට) ඇති කරන්නෙමු.

*(අල්කුර්ආන්-25:19)*

හදීස් කුදුස්හි අල්ලාහ් පැවැසූ බව මෙසේ වාර්තාවේ.

[إني حرمت الظلم على نفسي وجعلته بينكم محرما فلا تظالموا] (رواه مسلم)

මාගේ දාසයිනි, අපරාධය මා මාහට තහනම් කළෙමි. එය ඔබලා අතරද තහනම් ලෙසට පත් කළෙමි. එනිසා, ඔබලා කිසි යම් කෙනෙකුට හෝ අපරාධ නොකරන්න.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

අපරාධය වර්ග තුනකට බෙදේ. ඒවා මෙසේය.

## 1-දෙවියාට කරන අපරාධය

දාසයා තම දෙවියාට කරන අපරාධය මහුව ප්‍රතික්ෂේප කිරීමෙන් සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿والكافرون هم الظالمون﴾ [البقرة:٢٥٤]

ප්‍රතික්ෂේප කරන්නන් හෙතම අපරාධ කරුවන්ය.

*(අල්කුර්ආන්-2:254)*

සමහර ඇදහීමයන් අල්ලාහ් හැර වෙනත් කෙනෙකුට යොමු කිරීම සේම, මහුගේ ඇදහීමයන්හි සමාන කිරීමෙන්ද මෙය සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إن الشرك لظلم عظيم﴾ [لقمان :١٣]

නියත වශයෙන්ම, අල්ලාහ්ට සමාන කිරීම ඉමහත් අපරාධයෙකි. *(අල්කුර්ආන්-31:13)*

## 2-මිනිසාට කරන අපරාධය

මිනිසා අන් මිනිසාට කරන අපරාධය මවුන්ගේ නම්බුව, ශරීරය හා ධනයන් කෙරෙහි අක්‍රමවත් ලෙස හානි ඇති කිරීමෙන් සිදුවේ. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[كل المسلم على المسلم حرام : دمه، وماله، وعرضه] (رواه البخاري)

සෑම මුස්ලිම් වරයාගේම ප්‍රාණය, සම්පත හා නම්බුව වෙනත් මුස්ලිම් වරයාට තහනම්ය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

[من كان عنده مظلمة لأخيه من عرض أو شيء فليتحلله منه اليوم من قبل أن لا يكون دينار ولا درهم ، إن كان له عمل صالح أخذ منه بقدر مظلمته ، وإن لم يكن له حسنات أخذ من سيئات صاحبه فحمل عليه]

(رواه البخاري)

කවරෙකු හෝ තම සහෝදරයාව අවනම්බුවට පත්කර හෝ කිසියම් දෙයක් පැහැර ගෙන හෝ අපරාධ කළේද, දීනාර් හා දිර්හම් (කිසිවෙකු) පල නොදෙන දිනය පැමිණීමට පෙර ඔහු එම අපරාධයෙන් නිදහස්වී සිටිය යුතුයි. ඔහු සතුව කුසල් තිබේනම්. ඔහු කළ අපරාධයෙහි ප්‍රමාණයට එයින් ගැනෙනු ලැබේ. ඔහු සතුව කුසල් නොවත්තේනම්. ඔහු මගින් අපරාධයට ලක්වූ තැනැත්තාගේ අකුසල් ඔහු මත පටවනු ලැබේ.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## 3-සිය ආත්මයට කරන අපරාධය

මිනිසා තමාගේ ආත්මයට කරන අපරාධය, තහනම් කාරය යන්හි යෙදීමෙන් සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وما ظلمونا ولكن كانوا أنفسهم يظلمون﴾ [البقرة:٥٧]

තවද, ඔවුන් අපහට අපරාධ නොකළහ. නමුදු, ඔවුන් තම ආත්මයටම අපරාධ කරමින් සිටියහ.

*(අල්කුර්ආන්-2:57)*

තහනම් දේහි යෙදීම තම ආත්මයටම කරන අපරාධයෙකි. මන්ද, මෙසේ යෙදීම අල්ලාහ්ගේ දඬුවම අනිවාර්ය කරයි.

# ඊර්ෂ්‍යා කිරීම

මුස්ලිම්වරයා වැළකී සිටීමට අනිවාර්යවූ නින්දිත ගුණාංග යන් අතර ඊර්ෂ්‍යා කිරීමද එකකි. මක්නිසාදයත්, අල්ලාහ් තම දාසයන්ට බෙදා ඇති දේ කෙරෙහි ප්‍රතික්ෂේප කිරීම මෙහි සිදු වන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿أم يحسدون الناس على ما آتاهم الله من فضله﴾ [النساء: ٥٤]

අල්ලාහ් මිනිසුන්ට ලබාදී ඇති ඔහුගේ දායාදයන් පිළිබඳව ඔවුන් ඊර්ෂ්‍යා කරන්නාහිද ?

*(අල්කුර්ආන් -4:54)*

*ඊර්ෂ්‍යාව වර්ග දෙකකින් සමන්විතවේ.*

1 - පුද්ගලයෙකු සතු සම්පත් හෝ දැනුම් ඥානය හෝ බලය යන දායාදයන් තමාට ලැබීම සඳහා ඔහුගෙන් ඉවත් විය යුතුයි යනුවෙන් ආශාවීම.

2 - පුද්ගලයෙකු සතු දායාදයන් තමාට නොලැබුවද, ඔහුගෙන් ඉවත්විය යුතුයි යනුවෙන් ආශාවීම.

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[إياكم والحسد، فإن الحسد يأكل الحسنات كما تأكل النار الحطب أو العشب] (رواه أبو داود)

ඊර්ෂ්‍යා කිරීම ගැන මා ඔබලාට අවවාද කරමි. මක්නිසාදයත්, ගින්න දර මිටිය විනාශ කරන සේම, ඊර්ෂ්‍යාව කුසල් කාර්ය යන් විනාශ කරයි.

*(අබුදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

පුද්ගලයෙකු සතුව ඇති දායාදයන් ඉවත්විය යුතුයි යනුවෙන් අපේක්ෂා නොකර, එවන් පුද්ගලයා සතු දායාදයන් තමන්හටද ලැබීමට අපේක්ෂා කිරීම ඊර්ෂ්‍යා නොවන්නේය.

## වංචා කිරීම

මුස්ලිම් වරයා තම සහෝදරයින් අතර විශ්වාසියෙකු ලෙස සිටිය යුතු අතර, කිසියම් කෙනෙකුට හෝ වංචා නොකළ යුතුයි. එනිසා, තමාට කැමැතිවන දේම තම සහෝදරයාටද කැමැතිවිය යුතුයි. මුස්ලිම් ග්‍රන්ථයෙහි වාර්තාවී ඇති පරිදි මුහම්මදු (සල්) තුමා 'කවරෙකු අපව රැවටෙන්නේද? ඔහු අපේ අයෙකු නොවන් නේය' යනුවෙන් පවසන්නේය.

දිනක් නබි මුහම්මදු (සල්) තුමානන් (කඩ වීදියෙහි) ආහාර ගොඩක යාබදව ගමන් කළ අවස්ථාවේ තම අත එහි ඇතුල් කළ විට එහි තැන ගතිය දැනගත් එතුමා 'ආහාර වෙළෙන්දනි, මෙය කුමක්ද ? යනුවෙන් විමසීය. එයට ඔහු 'අල්ලාහ්ගේ දූතයා නෙනි, වැහි ජලයෙන් එය තැමින' යනුවෙන් කීය. එවිට එතුමා 'මිනිසුන්ගේ බැල්මට දැනෙන පරිදි එය උඩට දැමිය නොහැකි ද ?' යනුවෙන් අසමින් 'කවරෙකු අපට වංචා කරන්නේද ? ඔහු අපට අයත් අයෙකු නොවන්නේය' යනුවෙන් පැවැසීය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## අහංකාර කිරීම

සමහර අවස්ථාවක මිනිසා තම දැනුම් ඥානය පිළිබඳව අහං කාර කරයි. එමගින් ඔහු වෙනත් මිනිසුන්ට හෝ දැනුම් ඥාන වන්තයින්ට හෝ වඩා තමා ශ්‍රේෂ්ඨයා බව සිතා ඔවුන්ව පහත් කමින්ද දකින්නට පටන් ගනී. සමහර අවස්ථාවක මිනිසා තම ධනය ගැන අහංකාර කරයි. මෙමගින් ඔහු තමා අන් මිනිසුන්ට වඩා ශ්‍රේෂ්ඨයා ලෙස සිතයි. එසේම සමහර අවස්ථාවක මිනිසා

තම කුසලතා හෝ ඇදහීමයන් හෝ මෙවැන්නන් ගැනද අහංකාර කරමින් සිටින්නේය.

නමුත්, සත්‍ය මුස්ලිම්වරයා මෙවන් අහංකාර කමෙන් වැළකී සිටිමින් ඒ පිළිබඳව අවධානයෙන් සිටී. නිසැකයෙන්ම ෂෛතාන් (යක්ෂයා) ස්වර්ගයෙන් පිටමන්වීමට හේතුවූයේ ඔහුගේ අහංකාරකම බව මුස්ලිමෙකු සිතයි. එසේම, ආදම් (අලෛ) නබිතුමාට (හිස නමා) සුජූදය කරන ලෙසට අල්ලාහ් ඔහුට අණ කළ විට ඔහු 'මා ඔහුට වඩා ශ්‍රේෂ්ඨයාය. ඔබ මාව දල්වන ගින්නෙන් නිර්මානය කළේය නමුත්, ඔබ ආදම් මැටිවෙ පස්වලින්ය' යනුවෙන් කීය. මෙය ඔහු අල්ලාහ්ගේ දායාදයෙන් පිටමන් කිරීමට හේතු වීය. මෙම අහංකාර කමට ඖෂධය වන්නේ, මිනිසෙකු තමාට අල්ලාහ් අදට ලබාදී ඇති දැනුම් ඥානය, ධනය හා ආරෝග්‍ය භාවය වැනි දායාදයන් කිසියම් මොහොතක හෝ උදුරා ගැනීමට අල්ලාහ් ඉතා ශක්ති වන්තයා බව තේරුම්ගෙන සිටීමකි.

# ගුණධර්මය වර්ධනය කිරීමේ මාර්ග

තම ආත්මයට හුරුවූ ගුණාංග වෙනස් කිරීම මිනිස් ස්වභාවයට ඉතා බරක්වූ කාර්ය යන්නෙහි කිසියම් සැකයක් නොමැත. නමුත් මෙය නොහැකි කාර්යයක්ද නොවන්නේය. එබැවින්, විවිධ කාරණාවන් හා මාර්ගයන් මගින් මිනිසා යහපත් ගුණාංගයන් වර්ධනය කළ හැක. ඒවා මෙසේය.

## 1-සත්‍ය ප්‍රතිපත්තිය

ප්‍රතිපත්තිය විශිෂ්ඨම කරුනක්ය. වැඩි වශයෙන් මිනිසාගේ ගුණාංගයන් ඔහුගේ චින්තනා ප්‍රතිපත්තිය හා ඔහු පිළිපදින ධර්මයෙහි ප්‍රතිබිම්බයක් බව පවතී. එපමණක් නොව, නියත වශයෙන්ම, ප්‍රතිපත්තිය හෙතාම විශ්වාසයෙකි.

විශ්වාසීන් අතරෙහි, විශ්වාසයෙහි පරිපූරණ වන්නයා මවුන් අතර සිටින සත් ගුණධර්ම ශීලයාය. ප්‍රතිපත්තිය නිසි ලෙස පවතින්නේනම්, එමගින් ගුණධර්මයන්ද යහපත් ශීලයෙන් පවතී. සත්‍ය ප්‍රතිපත්තිය මහුට සත්‍ය භාවය, දානය කිරීමේ හැකියාව, ඉවසීම, වීරකම යන සත් ගුණධර්මයන් කෙරෙහි රැකුල් දෙයි. එසේම, අසත්‍ය භාවය, ලෝභකම නොදැනුවත් කම යන අයහපත් ගුණාංගයන් කෙරෙහි මහුව වළක්වයි.

## 2-ප්‍රාර්ථනාව

ප්‍රාර්ථනාව ඉතා විශාලම දොරටුවකි. එය දාසයෙකුට විවෘත වූයේනම්, එම මාර්ගයෙන් කුසල් හා දායාදයන් අඛණ්ඩවම පැමිණමින් පවතී. කවරෙකු යහපත් ගුණධර්මයන් පිළිපැදීමට හා අයහපත් ගුණාංගයෙන් වැළකී සිටීමට අපේක්ෂා කරන්නේද, මහු අල්ලාහ් කරා යොමුවිය යුතුයි. මහු මහුට යහපත් ගුණධර්මයන් වර්ධනය කර, අයහපත් ගුණාංගයන් මහුගෙන් ඉවත් කරයි.

මෙම කරුණු මත හා වෙනත් කාරණා අනුව ප්‍රාර්ථනා කිරීම ඉතා ප්‍රයෝජන දායකය. මෙනිසා නබි මුහම්මදු (සල්) තුමා තම දෙවියා වෙත ඉතා කීකරුවෙන් තමාට යහපත් ගුණධර්මයන් ලබා දෙන ලෙස අධිකව ප්‍රාර්ථනා කරන්නේය. එතුමා සලාතයේ ආරම්භක ප්‍රාර්ථනාවේදී මෙසේ ප්‍රාර්ථනා කරමින් සිටින්නේය.

[اللهم اهدني لأحسن الأخلاق ، لا يهدي لأحسنها إلا أنت ،

واصرف عني سيئها، لا يصرف عني سيئها إلا أنت] (رواه مسلم)

දෙවියනේ, සත් ගුණධර්මයන් කරා මාහට සුමග පෙන්වනු මැනවි. සත් ගුණධර්මයන් කරා මාහට සුමග පෙන්වන්නා ඔබ හැර අන් කිසිවෙකු නොමැත. අයහපත් ගුණාංගයන්

මගෙන් ඉවත් කරනු මැනවි. අයහපත් ගුණාංගයන් මගෙන් ඉවත් කරන්නෙකු ඔබ හැර අන් කිසිවෙකු නොමැත.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## 3-සටන් කිරීම

මෙම කාර්යයෙහි සටන් කිරීම පලදායක කරුණෙකි. සත් ගුණධර්මයන් පිළිපැදීමටත්, අයහපත් ගුණාංගයෙන් වැළකී සිටීමටත් තම සිත්සතන් සමග කවරෙකු සටන් කරන්නේද, ඔහුට අධික කුසල් ලැබෙන අතර, ඔහු වටා පිරිවරාමින් ඇති අකුසල් ඉවත්වේ.

යහපත් ගුණ ධර්මයන් අතර ස්වභාවික හා උනන්දුවෙන් තමා වර්ධනය කරගන්නා යහපත් ගුණාංගයන් ඇත. සටන් කිරීම යනුවෙන් හැඳින්වන්නේ, පුද්ගලයෙකු තම සිත්සතන් සමග වරක් හෝ දෙවරක් හෝ කීප වතාවක් හෝ සටන් කිරීමක් නොවේ. නමුදු, සටන් කිරීම යනු මරණය දක්වාම සටන් කිරීමකි. මක්නිසාදයත්, සටන් කිරීම ඇදහීමයෙකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿واعبد ربك حتى يأتيك اليقين﴾ [الحجر:٩٩]

ඔබට මරණය සිදුවන තෙක් ඔබ දෙවියාව අදහන්න.

*(අල්කුර්ආන්-15:99)*

## 4-ස්ව පරීක්‍ෂා කිරීම

තම අයහපත් ගුණාංග කෙරෙහි එහි නිවැරදි භාවය ගැන තමා විසින්ම ස්වපරීක්‍ෂා කළ යුතු අතර, නැවත වරක් මෙම ගුණාංගයෙහි නොයෙදීමට අධිටන් කළ යුතුයි.

## 5-සත් ගුණධර්ම මගින් සිදුවන කුසල් ගැන සිතීම

නියත වශයෙන්ම, සමහර කාර්යයන්හි පල ප්‍රයෝජනයන්

පිළිබඳව දැන සිටීම හා එහි අවසාන යහපත් තීරණය ගැන සිතුවිලිමත් වීම, ඒවා ක්‍රියා කිරීමටත් පිළිපැදීමටත් ඒ වෙතු වෙත් උනන්දු වීමටත් ඉමහත් හේතු දායක වන්නේය.

## 6- අයහපත් ගුණාංගයෙහි අවසානය ගැන සිතීම

එනම්, අයහපත් ගුණාංගය මගින් සිදුවන ස්ථිර කණගාටුව, අඛණ්ඩ ශෝකය, හානිය, දුක හා මිනිසුන්ගේ සිත් සතන් තුල සිදුවන අසතුට යනාදියන් ගැන සිතා බැලිය යුතුයි.

## 7- සිත පදම් කිරීමෙහි අවිශ්වාස නොකිරීම

අවිශ්වාස කිරීම මුස්ලිම් වරයාට යහපත් නොවන අතර, එය කිසිදු දිනක හෝ ඔහුට සුදුසුද නොවන්නේය. නමුත්, තම ඇල්ම ශක්තිමත් කර සිත්සතන පරිපූරණ කිරීමට හා තම අඩුපාඩු නිවැරදිකර ගැනීමට උත්සාහ කිරීම අවශ්‍යවේ.

## 8- මුහුණ ප්‍රබෝධවීම හා අප්‍රසන්නවීමෙන් වැළකීම

පුද්ගලයෙකු තම සහෝදර මුස්ලිම්වරයාව මුහුණේ ප්‍රබෝධ යෙන් බැලීම දානයෙකි. එයට කුලියද ලැබෙන්නේය. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[تبسمك في وجه أخيك صدقة] (أخرجه الترمذي)

ඔබ ඔබේ සහෝදරයාව මුහුණේ ප්‍රබෝධයෙන් බැලීම ඔබට දානයෙකි. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

[لا تحقرن من المعروف شيئا ولو أن تلقى أخاك بوجه طلق]

(رواه مسلم)

ඔබ සහෝදරයාව මුහුණේ ප්‍රබෝධයෙන් හමුවීම ඇතුලු කිසි යම් යහපත් කාර්යයක්ද ඔබ ස්වල්ප ලෙස නොසිත්න.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## 9-නොදිවීම හා නොසැළකීම

මෙම ගුණාංග දෙක උගතුන් හා ශ්‍රේෂ්ඨයන්ගේ ගුණාංග වේ. මෙය ආදරය වර්ධනය කිරීමටත් එය අඛණ්ඩව පවත්වා ගෙන යාමටත්, විරෝධී භාවය වළලීමටත් සහායවේ.

## 10-ඉවසීම

ඉවසීම ගුණාංගයන් අතර ඉතා උතුම් හා ඥාන වන්තයන්ට සුදුසු සත් ගුණධර්මයෙකි. ඉවසීම යනුවෙන් හැඳින්වන්නේ, කෝපය නැගෙනවිට සිත මෙල්ල කිරීමකි. නමුදු, ඉවසිලි වන්තයා කෝප නොවී සිටීම ඉවසීමෙහි කොන්දේසියක් නොවන්නේය. ඔහු කෝපය නැගෙන විට තම ඉවසිලි භාව යෙන් එය මෙල්ල කරයි. කෙනෙකු ඉවසිලි භාවයෙන් සිටින් නේනම්, ඔහුට ආදරය දක්වන්නන් අධික වන අතර, ඔහුව අප්‍රිය කරන්නන් අඩුවේ. ඔහුගේ තරාතිරමද උසස්වේ.

## 11-නුගතුන්ගෙන් ඉවත්වීම

කවරෙකු හෝ නුගතුන්ගෙන් ඉවත්වී සිටින්නේද, ඔහු තම නම්බුව රැකගෙන සිත්සතනට සැනසීම ලබා ගනී. එසේම තමාට බාධා කරන දේ කෙරෙහි සවන්දීමෙන් වැළකී සිටී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿خُذِ الْعَفْوَ وَأْمُرْ بِالْعُرْفِ وَأَعْرِضْ عَنِ الْجَاهِلِينَ﴾ [الأعراف:١٩٩]

(නබිතුමනි) සමාවනීය භාවය අනුගමනය කරන්න. කුසල් (කාර්යයන්) පිළිපදින මෙන් අණ කරන්න. නුගතුන්ගෙන් වැළකී සිටින්න. *(අල්කුර්ආන්-7:199)*

## 12-බැණවැදීමෙන් වැළකීම

මිනිසුන්ට බැණ වැදීමෙන් වැළකී සිටීම සත් ගුණධර්මයකි.

## 13-පීඩාවන් අමතක කිරීම

ඔබට හිරිහැර කළ අය කෙරෙහි ඔබේ සිත පවිත්‍රවීම සඳහා එම හිරිහැරයන් අමතක කළ යුතුයි. මහුව අන් අය ලෙස නොසැළකිය යුතුයි. මක්නිසාදයත්, තම සහෝදරයන් කළ හිරිහැරයන් අමතක නොකර ඒවා සිහිකර සිටින්නාට ඔවුන් සමග උතුම් ජීවිතයක් ගත කළ නොහැක. එබැවින්, හැකි තාක් එම හිරිහැරයන් අමතක කළ යුතුයි.

## 14-සමාවීම හා අකුසල් කරන්නාට කුසල් කිරීම

මෙසේ කිරීම තරාතිරම උසස්වීමට හේතු වන්නේය. තමාගේ සිතට මෙයින් සැනසීමද පළිගැනීමේ චේතනාවෙන් නිදහස්ද ලැබෙන්නේය.

## 15-දානය කිරීම

දානය කිරීම උතුම් ගුණධර්මයෙකි. ලෝභකම නින්දාව ඇති කරන සේම, දානය කිරීම ආදරය ඇති කරයි. අසතුට ඉවත් කරයි. යහපත් කීර්ති නාමය ලබාදී අඩුපාඩුකම හඟවයි.

## 16-අල්ලාහ්ගේ කුලිය සත්‍ය බව සිතීම

යහපත් ගුණධර්මයන් වර්ධනය කිරීමට සහායවන කාර්ය යන් අතර උතුම් කාර්ය අල්ලාහ්ගේ කුලිය කෙරෙහි විශ්වාස කිරීමකි. මෙය ඉවසීම, සිත් සතන් සමග සටන් කිරීම හා මිනිසුන්ගේ හිරිහැරයන් ඉවසා සිටීම යනාදීන් සඳහා සහාය වන්නේය. කවරෙකු තම සත් ගුණධර්මයන්ට හා සිත් සතන් සමග කරන සටනට නිසැකව, අල්ලාහ් කුලිය පිරිනමන බව ස්ථිරයෙන් විශ්වාසය කරන්නේද, මහු සත් ගුණධර්ම යන් වර්ධනයකර ගැනීමට උනන්දුව දක්වයි. මෙම මගෙහි මහු මුහුණපාන කරුණු සියල්ල මහුට පහසුවෙන් පවතී.

## 17-කෝපවීමෙන් වැළකීම

නියත වශයෙන්ම, කෝපවීම සිත්සතන් තුල දැල්වන ගිනි නෙකි. මෙය දඩුවම් කිරීමටත්, පළි ගැනීමටත් උසිගන්වයි. මිනිසා කෝපයට පත්වනවිට තම සිත්සතන මෙල්ලකර ගත් තේනම්, ඔහු තම ආත්ම ගෞරවය හා ගරුත්වය රැක ගනී. නිදහසට කරුණු සෙවීමේ නින්දාවෙන් හා දුකෙන් තමාව වළක්වා ගනී. අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන් නේය.

[جاء رجل فقال : يارسول الله ، أوصني فقال : لا تغضب ، ثـــم ردد مرارا، فقال: لا تغضب] (رواه البخاري)

මිනිසෙකු පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මාහට උපදෙස් කරන්න' යනුවෙන් නබි තුමාගෙන් විමසූකළ එතුමා 'කෝප නොවන්න' යනුවෙන් උපදෙස් කළේය. ඔහු නැවත නැවත උපදෙස් කරන මෙන් විමසීය. එවිටද 'ඔබ කෝප නොවන්න' යනුවෙන් එතුමා පැවැසීය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## 18-උපදෙස් හා විමර්ශන පිළිගැනීම

තම අඩුපාඩුවත් පෙන්වා දෙනවිට එයින් වැළකී සිටීම සඳහා ඒවා පිළිගැනීම ඔහුට අනිවාර්‍යවේ. මක්නිසාදයත්, තමාගේ අඩුපාඩුවන් නොදැනෙන බව රැගපෑම මගින් සිත ශීලාචාර කිරීමට නොහැක. එනිසා අර්ථවත් උපදෙස් හා සාර්ථකවත් විමර්ෂන පිළිගත යුතුයි.

## 19-පවරන කාර්ය පරිපූර්ණයෙන් ඉටුකිරීම

මෙමගින් නින්දාව, තර්ජනය, නිදහසට කරුණු කීම සහ පහත්කම යනාදීන්ගෙන් වැළකීමට හැක.

## 20-වරද පිළිගැනීම හා එය සාධාරණය කිරීමෙන් වැළකීම

මෙය යහපත් ගුණධර්මයේ සළකුනක් වන අතර, අසත්‍යය ප්‍රකාශ කිරීමෙන්ද වළක්වයි. වරද පිළිගැනීම ගුණධර්මයකි. මෙම ගුණාංගය මෙවැන්නන්ගේ ගෞරවය ශ්‍රේෂ්ඨ කරයි.

## 21-සත්‍යභාවය වෙළාගැනීම

නියත වශයෙන්ම, සත්‍ය භාවයට විශිෂ්ඨ පල ප්‍රයෝජනයන් තිබේ. මෙමගින් පුද්ගලයෙකුගේ තරාතිරම හා ගෞරවය ශ්‍රේෂ්ඨවේ. මෙම ගුණාංගය අසත්‍ය නම්වූ කිලිටුවෙන්ද, සිත් තැවුලෙන්ද හා සාධාරණය කිරීමේ නින්දාවෙන්ද රැක ගනී. එම සත්‍ය භාවය ඔහුට ගෞරවය, වීරකම, නම්බුව යනාදීන් ලබා දෙන සේම, මිනිසුන් ඔහුට අපරාධ කිරීමෙන්ද, ඔහුගේ නම්බුවට හානි කිරීමෙන්ද ඔහුව ආරක්‍ෂා කරයි.

## 22-නින්දා කිරීමෙන් හා පරුෂ වචන කීමෙන් වැළකීම

අධික නින්දා කිරීම කෝපය උසිගන්වයි. විරුද්ධතාවය ඇති කරයි. කරදරයන් සිදුකරන දේ කෙරෙහි සවන්දීමට යොමු කරයි. එහෙයින්, සත්‍ය වන්තයා කුඩා හෝ ලොකු කිසියම් වරද්දක් සඳහා හෝ තමාගේ සහෝදරයාට (නින්දිත ලෙස හෝ පරුෂ වචනයෙන් හෝ) අවවාද නොකරයි. 'ඔහු එසේ කර ඇත්තේ, කුමක් හෝ හේතුවක් නිසා විය හැක' යනු වෙන් සිතයි. අවවාද කළම යුතුනම්, සිනිඳු භාවයෙන් අව වාද කරයි.

## 23-උගතුන් හා යහපතුන් සමග මිත්‍රත්වය පවත්වීම

උගතුන් හා යහපතුන් සමග මිත්‍රත්වය පවත්වීම යහපත් ගුණධර්මයන් පුහුණු කිරීමටත්, එය සිත්සතන් තුල තැන් පත් කිරීමටත් ඉමහත් ශ්‍රේෂ්ඨම මාර්ගයෙකි.

## 24-සාකච්ඡා හා සභා පිළිවෙල් පිළිපැදීම

සාකච්ඡාවෙහි අදහස් යොමු කරන්නාගේ කතා බහවලට සවන්දීම, ඔහුගේ කතාව විසන්ධි කිරීමෙන් හෝ අසත්‍ය කිරීමෙන් හෝ එය අල්පවත් ලෙස සිතීමෙන් හෝ ඔහු තම කතාව අවසන් කිරීමට පෙර නැගිට්ට යාමෙන් හෝ වැළකී සිටීම අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු පිළිවෙල්ය. එසේම, සභාව තුල පිවිසනවිට හා සභාවෙන් පිටත්වනවිට සලාම් කීම, සභාවෙහි අන් අය වෙනුවෙන් ස්ථානය විශාල කිරීම, කෙනෙකු නැගිට්ටවා ඒ ස්ථානයේ තමා අසුන් නොගැනීම, දෙන්නා අතර ඔවුන්ගේ අනවසරයෙන් අසුන් නොගැනීම, තුන්දෙනා සිටින කළ දෙන්නා සමග පමණක් පෞද්ගලිකව රහස් කතා නොකිරීම යනාදීන්ද සභාවෙහි පිළිවැල්ය.

## 25-නබිතුමාගේ චරිත කතාව අඛණ්ඩව කියවීම

නබිතුමාගේ ජීවිත චරිතය කියවන්නන්ට මිනිස් සංහතිය නුදුටු ඉතා උතුම් ආදර්ශයන්ද, මිනිස් ජීවිත යට පරිපූරණ මග පෙන්වීම්ද, යහපත් ගුණධර්මයන්ද ලබා දෙන්නේය.

## 26-සහාබාවරුන්ගේ ජීවිතය ගැන අවධානය යොමු කිරීම

## 27-ගුණධර්මය පිළිබඳ පොත්පත් කියවීම

නිසැකයෙන්ම, මෙවන් පොත්පත් කියවීම මිනිසාට යහපත් ගුණධර්මයන් කෙරෙහි උනන්දුව දක්වයි. එහි විශේෂය සිහි ගන්වයි. එම ගුණාංගයන් වර්ධනයකර ගැනීම සඳහා ඔහුට සහාය දක්වයි. එසේම,එම පොත්පත් අයහපත් ගුණාංගයන් ගැන ඔහුට අවවාද කරයි. එහි අවසාන (පිළිකුල්) තීන්දුව කෙරෙහි වැළක්වීමට අයත් මග පෙන්වීම් ඔහුට පැහැදිළි කරයි.

# පටුන


| අනු අංක | විෂය | පිටු අංක |
|---|---|---|
| 1 | යහපත් ගුණධර්මයෙහි සළකුණු | 8 |
| 2 | නබිතුමාගේ ගුණධර්ම | 9 |
| 3 | සත්‍යභාවය | 12 |
| 4 | භාරකාරත්වය | 14 |
| 5 | බැගෑපත්කම | 16 |
| 6 | ලැජ්ජාවීම | 17 |
| 7 | අහපත් ගුණාංගයන් | 18 |
| 8 | ගුණධර්මය වර්ධනය කිරීමේ මාර්ග | 23 |


# محتويات الكتاب


| الصفحة | الموضوع |
|---|---|
| ٨ | ١-علامات حسن الخلق |
| ٩ | ٢-أخلاق الرسول |
| ١٢ | ٣-الصدق |
| ١٤ | ٤-الأمانة |
| ١٦ | ٥-التواضع |
| ١٧ | ٦-الحياء |
| ١٨ | ٧-أخلاق ذميمة |
| ٢٣ | ٨-الوسائل المعينة في اكتساب الأخلاق |

## محتويات الكتاب


علامات حسن الخلق

أخلاق الرسول صلى الله عليه وسلم

الصدق

الأخلاق السيئة

الوسائل المعينة في اكتساب الأخلاق الحميدة


## මෙම පොත තුළ


යහපත් ගුණදර්මයේ සලකුණු

නබි තුමාගේ ගුණධර්ම

සත්‍යභාවය

අයහපත් ගුණාංග

ගුණධර්මය වර්ධනය කිරීම



للمساهمة في طباعة الكتاب

شركة الراجحي - ٢٠٤٠١٠٩٠٩٢



المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة بالرياض

تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد

هاتف: ٢٥٩٢٧٢٢ فاكس: ٤٧٥١١٧٥ البريد الإلكتروني: mrawdhah@hotmail.com ص.ب ٨٧٢٩٩ الرياض ١١٦٤٢



ردمك: ٩٩٦٠-٥١٢-٩٣-٤ [illegible]